**නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය**
**சுதந்திரமானதும் நீதியானதுமான தேர்தலுக்கான மக்கள் இயக்கம்**
**Campaign for Free & Fair Elections**

CaFFE

**2,1/1, Dharmapala Place, Rajagiriya. t: 0114341524 . caffesrilanka.lk@gmail.com**
**www.caffesrilanka.lk**


# "මන්ත්‍රී තිස්සකුට්ටිආරච්චි සමස්ත කාන්තා ප්‍රජාවම අපකීර්තියට ලක් කළා"
## - කැෆේ සංවිධානය කියයි

පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස කුට්ටිආරච්චි මහතා පසුගියදා පාර්ලිමේන්තුව අමතමින් කාන්තාවන්ට අපහාස වන අන්දමේ ප්‍රකාශයක් කර ඇති බව කැෆේ සංවිධානය පවසයි. එම සංවිධානයේ අධ්‍යක්ෂිකා සුරංගි ආරියවංශ මහත්මිය පෙන්වා දෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස කුට්ටිආරච්චි මහතා පාර්ලිමේන්තු වරප්‍රසාද වලට මුවාවී පාර්ලිමේන්තු මන්ත්‍රිනි රෝහිණී කවිරත්න සහ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාගේ බිරිඳට අපහාස වන ආකාරයේ අසභ්‍ය ප්‍රකාශනයක් සිදුකිරීම ශිෂ්ට සමාජයක් විසින් අනුමත නොකරන බවයි.

රටේ උත්තරීතර ආයතනය වන පාර්ලිමේන්තුව තුළදී  පවා කාන්තාව මෙලෙස හැල්ලුවට ලක් කරන්නේ  නම් තිස්ස කුට්ටිආරච්චි වැනි මන්ත්‍රී වරුන්  ජනතාවට නායකත්වය ලබාදෙන ආකාරය පිළිබඳ සිතාගත හැකි බව ආරියවංශ මහත්මිය අවධාරණය කරයි. කුමන තරාතිරමක සිටිය ද මුවින් පිටවන්නේ පුද්ගලයෙකුගේ බුද්ධියේ සහ අධ්‍යාපනයේ ප්‍රමාණය බව තිස්ස කුට්ටිආරච්චි මන්ත්‍රීවරයා විසින් තවදුරටත් පාර්ලිමේන්තුව හමුවේ තහවුරු කර ඇති බවද කැෆේ සංවිධානයේ අධ්‍යක්ෂිකාව පෙන්වා දෙයි.

පාර්ලිමේන්තුවේ උත්තරීතර බව නොදත් මෙවැනි මන්ත්‍රීවරුන්ගේ හැසිරීම් නිසා ජාත්‍යන්තරය හමුවේ රට අපකීර්තියට පත්වන බවත් ජන නායකයින් කෙරෙහි මෙරට සමස්ත කාන්තා පරපුරේ විශ්වාසය ගිලිහී යන බවත් ආරියවංශ මහත්මිය  වැඩිදුරටත් පෙන්වා දෙයි.

වර්තමානයේ දේශපාලනයේ නිරත කාන්තාව මුහුණ දී සිටින ප්‍රධාන අර්බුදය මෙවැනි "ඊනියා චණ්ඩි පිරිමින්ගේ " හැසිරීම් බව පෙන්වා දෙන ආරියවංශ මහත්මිය සඳහන් කරන්නේ මෙවැනි තර්ජනයන්ට මුහුණ දීම සඳහා බිම් මට්ටමේ දේශපාලනයේ නිරත කාන්තාව ශක්තිමත් කිරීමේ වැඩපිළිවෙළක් කැෆේ සංවිධානය විසින් මේ වනවිටත් දියත් කර ඇති බවයි.

මාධ්‍ය ඒකකය
කැෆේ සංවිධානය

2021 නොවැම්බර් 21 වන දින